සියලු ම හිමිකම්ඇවිරිණි All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 44 | S | I |
|---|---|---|

## Grade 11 – Diagnostic Test – August 2022

අනාවරණ පරීක්ෂණය – 2022 අගෝස්තු - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time: 1 hour

## නර්තනය – I

Name: - ..... class: -..... Index no: - .....

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) විලම්භ, මධ්‍ය හා ..... ලයට නර්තන අභ්‍යාස කිරීම ප්‍රායෝගික කුසලතා වර්ධනය වේ.

1. නෘත්‍ත
2. ධෘත්‍ත
3. ප්ලුත
3. වෘත

(2) ශ්‍රී ලංකාවේ ජන ජීවිතය හා බැඳි වාත්තීන් සම්බන්ධව නිර්මාණය වී ඇති ගැමි නැටුම් වශයෙන් ..... සැලකිය හැකිය.

1. මෝල්ගස්, කුලු, ගොයම්
2. චාමර, වේවැල්, ගොයම්
3. සවරම්, වේවැල්, කුළු
4. මෝල්ගස, ලී, කුළු .

(3) "උඩරට නැටුම් කලාව" කෘතිය ලියා පළ කොට ඇත්තේ ..... මහතා විසිනි.

1. මුදියන්සේ දිසානායක
2. ජේ.ඊ.සේදරමන්
3. ඩබ්ලිව්.බී.මකුලොලුව
4. කේ.එස්.ප්‍රනාන්දු

(4) රජයේ පාසැල් වල සෞන්දර්ය විෂයය අනිවාර්ය වූ යේ ..... වර්ෂයේදිය.

1. 1972
2. 1974
3. 1978
4. [illegible]

(5) "නවද අත්තා මුත්තා පනත්තා" මෙම පද කොටස අයත් ගායනය ..... කි.

1. වන්නම
2. ටීකාව
3. ප්‍රශස්තිය
4. සැහැල්ල

(6) "ඉද්‍රා දියාවට ඉඹුල් විමානෙට ඉරු දෙවි අධිපති" මෙම කවි පදය අයත් වන්නේ ග්‍රහයන් සඳහා කෙරෙන ..... ශාන්ති කවියටය.

1. කොහොඹා
2. මඩු
3. බලි
4. සූනියම්

(7) ඉතින් කියන්නේ තුන්වැනි වරට නටන්නේ ..... එන්නේ වට පිට නිතර බලන්නේ, ඉහත දැක්වෙ ජන නාටකය ගැලපෙන පදය වන්නේ,

1. සොකරි
2. වෙදා
3. පරයා
4. ගුරුවා

(8) රත්නපුර සමන් දේවාල පෙරහැරේදී ..... නැටුම වලට විශේෂ තැනක් තිබේ.

1. සබරගමු
2. උඩරට
3. කාවඩි
4. පහතරට

(9) පොලොන්නරුව සරස්වතී මණ්ඩලය ඉදි කරන ලද්දේ ..... රජුය.

1. I වන පරාක්‍රමභාහු
2. නිශ්ශංක මල්ල
3. II රාජසිංහ
4. දුටුගැමුණු

(10) පාසැල් නර්තනයෙහි අධ්‍යාපන ප්‍රවර්ධනය සඳහා දායක වූ ශිල්පිණියක් ලෙස නම් කළ හැක්කේ,

1. වජිරා චිත්‍රසේන
2. විරන්ඩා හේමලතා
3. වන්දලේඛා පෙරේරා
4. මිරියම් පිරිස්

(11) කෝලම් රහමඩල හදුන්වන්නේ,

1. අංගම් මඩුව
2. නානායම් පල
3. යක්ගෙය
4. වීදිය

(12) නර්තනයේදී අංග ප්‍රත්‍යංග ..... ලෙස ශරීර කොටස් වෙන්කොට දැක්වේ.

1. උපාංග
2. ගුනාංග
3. ශරිරිංග
4. පංචාංග

(13) කොහොඹ කළය සහ කාවඩි නැටුම් වඩාත් දැකිය හැක්කේ,

1. වේල්
2. මිහිදු
3. සංඝමිත්තා
4. දුරුතු

(14) බෙර ඇස සැකසීම සඳහා සිවියක් (හරක් බොක්ක) යොදා ගෙන ඇත්තේ ,

1. ගැටබෙරය
2. පහතරට බෙරය
3. දඩුබෙරය
4. පොකුරු බෙරය

• අංක 15 සිට 19 දක්වා පහත පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න.


A


B


C


D

(15) හපනා, ගිනිහොරා හා රන්කිකිළි මුද්‍රා නාට්‍ය නිර්මාපකයාගේ ඡායාරූපයට අදාළ අක්ෂරය වන්නේ,

1. A
2. B
3. C
4. D

(16) රජයේ ලලිත කලායතනයේ ප්‍රථම විදුහල්පතිවරයා / වරියගේ ඡායාරූපයට අදාළ අක්ෂරය වන්නේ,

1. A
2. B
3. C
4. D

(17) කරදිය මුද්‍රා නාට්‍යයේ වන්ඩිරාල හා සිසිගේ චරිත රඟ පෑ ශිල්පීන්ගේ ඡායාරූප වලට අදාළ අක්ෂරය පිළිවෙළින්,

1. A හා B ය.
2. B හා A ය.
3. B හා C ය.
4. C හා D ය.

(18) ස්වර්ණ තිලකා හා ග්‍රහ අපලය යන මුද්‍රා නාට්‍යය නිර්මානකරුවන්නේ ඡායා රූප වලට අදාළ අක්ෂරය වන්නේ,

1. A හා B ය.
2. B හා A ය.
3. B හා C ය.
4. C හා D ය.

(19) පාසැල් අධ්‍යාපනයේ අධ්‍යාපන උන්නතිය සඳහා දායක වන්නේ,

1. C
2. B
3. D
4. A

(20) සැවුලා වන්නමට අයත් බෙරපදය වනුයේ,

1. ජිං තරිකිට තත් දොම්කිට
2. දොංතකු දොංතකු දොං ජිං
3. දොං ජිං ජිං තකට දොංතක
4. දොං දොං ජිං ජිං ගජිගත

(21) උඩරට නර්තනයේ ප්‍රධාන ඇදුම් කට්ටලය ලෙස හඳුන්වන්නේ,

1. තනි කව්වි ඇදුම් කට්ටලය
2. බෙර ඇදුම් කට්ටලය
3. වෙස් ඇදුම් කට්ටලය
4. නෙඩි ඇදුම් කට්ටලය

(22) උඩරට වන්නමට අයත් කොටස් ගණන,

1. තුන කි.
2. පහ කි.
3. සය කි
4. අට කි.

(23) මාත්‍රා 3 +4 දෙතිනට අයත් කස්තිරමකි.

1. රුද ගජිත් තක තකට කුංදත්
2. රුද ගජිත රුද ගජිත
3. රුංතක ජිංතක ජිංතක ජිංකුද
4. රුද ගත ගත ගත කුකුදත්

(24) ගැට බෙරයෙහි කොටස් දෙකකි.

1. වලයම් හා සුරත් තට්ටුව
2. වෙනිවර හා සුරත් තට්ටුව
3. කැපුම් හම හා අඩ බැය
4. වණ්ඩම හා සරත් තට්ටුව

(25) තත් තකට තක රොට .....

1. හනුමා වන්නමේ අඩව්වකි.
2. මුසලඩි වන්නමේ අඩව්වකි.
3. තුරහා වන්නමේ අඩව්වකි.
4. සිංහරාජ වන්නමේ අඩව්වකි.

(26) සිංහල නර්තන කලාව ග්‍රන්ථය පලකරන ලද්දේ,

1. මහාචාර්ය තිස්ස කාරියවසම්
2. මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ
3. මහාචාර්ය ලයනල් බෙන්තරගේ
4. මහාචාර්ය මුදියන්සේ දිසානායක

(27) ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් ශ්‍රී ලංකාවට පැමිණියේ ..... යුගයේදී ය.

1. කෝට්ටේ
2. කොළඹ
3. මහනුවර
4. ගම්පල

(28) මේරුං විරාජිත සමං ..... ගායනයක් ලෙස සඳහන් කළ හැකිය.

1. ආසාත්මක
2. අනාසාත්මක
3. තාලාත්මක
4. කලාත්මක

(29) කෝලම් නාටකයේ ..... පූර්ව රංගයට අයත් අංගයකි.

1. නාරි ලතා කෝලම
2. මනමේ කෝලම
3. ආරව්වි කෝලම
4. ගිරිදේවි කෝලම

(30) ආංගික අභිනයේදී බේල්ල උරහාහු වැලමිට මැණික් කටුව අයත් වන්නේ ,

2. අංගවලට ය.
2. ප්‍රත්‍යංග වලට ය.
3. උපාංග වලට
4. නවාංග වලට ය.

• 31 සිට 32 වක්වා පහද දැක්වෙන් ඡායාරූප වලට අදාළව පිළිතුර තෝරන්න.


A


B


C

(31) පිළිවෙලින් විශ්මය හා ශාන්ත රූපය දැක්වෙන්නේ,

1. A හා C ය.
2. A හා Bය.
4. B හා C ය.
4. B හා A ය.

(32) A හා B ඡායා රූප වලින් දැක්වෙන චරිත පිළිවෙලින්,


A


B

1. වෙදරාල - සොකරි හා නොන්ඩ හෙන්වා මුදලිය.
2. පරයා - සොකරි හා ලෙන්විනා හෙන්වා මුදලිය.
3. සොකරි - ගුරුවා - ජස - ලෙන්විනා මුදලිය.
4. වෙදරාල - සොකරි සහ ලෙන්විනා හෙන්වා මුදලිය.

(33) නලහන රූප ඇතුලත් ලී කැටයම් ගණනාවක් දැකිය හැක්කේ,

1. ගඩල දෙනිය විහාරයේ
2. අවකාශ හා තාලරටා භාවිතයට.
3. යාපහුව මාලිගේය.
4. ලෝවාමහාපායේය.

(34) ප්‍රාසාංගික නර්තනය කාණ්ඩයකින් වේදිකාවක නර්තන නිර්මාණයක් ඉදිරිපත් කිරීමේදී විශේෂ අවධානය යොමු කළ යුතු වන්නේ,

1. අවකාශය හා රංග රට භාවිතයට
2. අවකාශ හා කාල රටා භාවිතයට
3. සැරසිලි හා වාදන රටා එනවිටය
4. සැරසිලි හා ගායන විධි භාවිතයට

(35) සිතාහරණ නාට්‍ය නාටකය නිෂ්පාදනය කරන ලද්දේ,

1. රවීන්ද්‍රනාත් තාගෝර් තුමා ය.
2. නිමල් වෙල්ගම ය.
3. ශාන්ති දේවිසෝන් ය.
4. උදය හංකර් ය.

(36) දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භයට හේතු පාදක වූ ශාස්ත්‍රෝක්ත නැමැති මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

1. රවී ශංකර්
2. උදය ශංකර්
3. රාම් ගෝපාල්
4. රවීන්ද්‍රනාත් තාගෝර්

(37) භරත නර්තනය ප්‍රවලිත කිරීම සඳහා පිහිටවන ලද ආයතනය වන්නේ,

1. කේරළ කලා මංඩලම්
2. කලා ක්ෂේත්‍රය
3. ශාන්ති නිකේතනය
4. හාත්ඛණ්ඩ විශ්ව විද්‍යාලය

(38) නර්තන ශිල්පිනියන් අතර හිසවෙස් තබා ප්‍රසිද්ධියට පත් කාන්තාවක් වන්නේ,

1. චිත්‍රා අල්ගම මහත්මිය
2. සිතා ගමගේ මහත්මිය
3. වන්ද්‍රලේකා පෙරේරාය.
4. වජිරා චිත්‍රසේන මහත්මියයි.

(39) කවිකාර මඩුවෙහි රජුගේ නාට්‍ය මණ්ඩලයට වන්නම් රචනා කළ බව කියැවෙන්නේ,

1. ඇහැලේපොල අදිකාරම්ය.
2. මොල්ලිගොඩ අදිකාරම්ය.
3. එක්නැරලිගොඩ අදිකාරම්ය.
4. රම්මොලවක අදිකාරම්ය.

(40) කොහොඹ කංකාරියේ පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වන්නේ,

1. කොහොඹා දෙවි හා දෙවොල් දෙවියන්ය.
2. කොහොම දෙවි හා බන්ඩාර දෙවියන්ය.
3. වීර මුණ්ඩ දෙවි හා මංගර දෙවියන්ය.
4. වීර මුන්ඩ දෙවි හා දෙවොල් දෙවියන්ය.



PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

©2022 All Rights Reserved



# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 - First Term Evaluation – August 2022
අනාවරණ පරීක්ෂණය – 2022 - අගෝස්තු - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time: 2hours

## නර්තනය – II

Name: - ..... class: -..... Index no: - .....

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(1)

I. කෝලම් නාටකයේ ප්‍රධාන ලක්ෂණයක් වනුයේ වරිත සඳහා ..... පැළඳීමයි.

II. කවිකාර මඩුවේදී වන්නම් ප්‍රදාන කොට රජුගෙන් ගම්වර ලබා ගන්නේ ..... අධිකාරමය.

III. "එදා හෙළදිව" කෘතිය රචනා කරන ලද්දේ ..... විසිනි.

IV. ලී දැනට රැගෙන කණුවක් වටේ රටා මවමින් නර්තනය කරන ද්‍රවිඩ ගැමි නැටුම් ..... නමින් හැඳින්වේ.

V. බලි ශාන්ති කර්ම වල පුද ලබන නව ග්‍රහයන් වන්නේ ගුරු සිකුරු අඟහරු රාහු ....., සඳු බුද ගුරු කෙහෙතුය.

VI. නන්දි කේශ්වර විසින් රචිත කෘතිය හඳුන්වන්නේ ..... නමිනි.

VII. මහා වංශය අනුව ..... රජු ඉදිරියේ දෙවිමිනිස් නැටුම් කර වූ බව ඉතිහාසයේ සඳහන් වේ.

VIII. නර්තනය අනිවාර්ය විෂයක් ලෙස පාසැල් විෂය මාලාවට ඇතුලත් කරන ලද්දේ ..... වර්ෂයේදීය.

IX. හොරණ ශ්‍රී පාලි ආයතනයට මුල් ගල තැබුවේ කිනම් වර්ෂයකද කවුරුන් විසින් ද?

a. වර්ෂය .....

b. කවුරුන්ද .....

X. ආගමික සිද්දස්ථානයන්හි හේවිසි වාදනය සඳහා හොරණෑව සමඟ යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ දෙක නම් කරන්න.

a. .....

b. .....

(2)

I. මාත්‍රා 1234 / 1234 තනි තිතට පෙර පදයක් ප්‍රස්ථාර කරන්න.

II. මාත්‍රා 3 +3 තාල රූපයට අයත් වන්නම්ක කවි පදයක් ප්‍රස්ථාර කරන්න.

III. මාත්‍රා 2 +4 තාල රූපයට අයත් වන්නගන කවි පදයක් ප්‍රස්ථාර කරන්න.

(3) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

a) වන්නම් b) මැන්ඩිය c) අභිනය

d) ගැටබෙරය e) මුද්‍රා නාට්‍ය

(4) ශාන්ති කර්ම වූ කලි දේශීය නර්තන කලාවේ අනන්‍ය ලක්ෂණ පිළිඹිමු කරන සාධකයකි.

i. කොහොඹ කංකාරියේ සිදු කෙරෙන චාරිත්‍ර 02ක් හඳුන්වන්න.

ii. උඩරට වෙස් ඇදුම් කට්ටලය පිළිබඳ විමසීමක් කරන්න.

iii. කොහොඹ කංකාරි පුරාවෘත්ත කථාව මඟින් සමාජයට ලබාදෙන උපදේශනය පිළිබඳ විග්‍රහයක් කරන්න.


(5)

I. කෝලම් හෝ සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු 02ක් ලියා රහ මඬල පිළිබඳව විස්තරයක් ලියන්න.

II. ගැමි සංස්කෘතියෙහි සමාජ සාරධර්ම හා විශ්වාස ගොඩ නැඟී ඇති ආකාරය ජන ශ්‍රී උදාහරණයකට ගෙන පෙන්වා දෙන්න.

III. නර්තන කලාවේ පෝෂණය සඳහා රචනා වූ පර්යේෂණාත්මක කෘතියක් නම් කර එහි පිළිබඳව විග්‍රහයක් කරන්න.

(6) පහල දැක්වෙන රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




I. A සහ B රූප වල ඇති දේශීය මුද්‍රා නාට්‍ය දෙක නම් කර ඉන් එක් මුද්‍රා නාට්‍යයක් පිළිබ හැඳින්වීමක් කරන්න.

II. භාරතීය නර්තන සම්ප්‍රදායන් දැක්වෙන රූප වල රංග වස්ත්‍රාභරණ වෙන් කොට දක්වන්න.

III. E රූපයේ දක්වෙන රූපවාහිනී නර්තනය ඇසුරෙන් වේදිකාවක භාවිත නාක්ෂණික ශිල්ප ක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.

(7) මානසික ස්වස්ථතාව පවත්වා ගෙන යෑම නර්තනයට ඉහවහල් වේ.

I. ගීත අනුව නර්තන නිර්මාණය කිරීමේදී රසවින්දනය වර්ධනය වන ආකාරය දක්වන්න.

II. ඉවසීම ප්‍රගුණ කිරීමෙහිලා නර්තනය මඟින් ලැබෙන පිටිවහල උදාහරණය සහිත දක්වන්න.

III. නිරෝගී දිවියකට නර්තනයෙන් ලැබෙන සහය කෙබඳු දැයි විමසන්න.



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න